**බෙන්තොට ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 නොවැම්බර් 22 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

ගිණුම් තැබීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ දී පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු බහු කාර්යය ජංගම කුටි 10 ක සහ පිරිවැය රු.52,450 ක් වූ භාණ්ඩ අයිතම 04 ක වටිනාකම් ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.4,467,185 ක දායක මුදල ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු.129,007 ක ස්ථාවර තැන්පත් පොලී ආදායම ලැබිය යුතු ආදායම් යටතේ ගිණුම්ගත නොකර සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ පෙර පාසලකට උපකරණ ලබාදීම සඳහා දරන ලද රු.13,200 ක වියදම තැන්පත් ගිණුමට බැර කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ නිලධාරීන්ගෙන් හා සේවකයින්ගෙන් වැටුප් රහිත නිවාඩු දින 165 ½ ක් වෙනුවෙන් අය වියයුතු රු.64,662 ක මුදල ගිණුම් ගතකර නොතිබුණි.

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.5,983,250 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.142,044 ක අසමානතා විය.

**1.3.4 ලැබිය යුතු ගිණුම්**

2011 වර්ෂයේ සිට පැවත එන එකතුව රු.2,666,539 ක් වූ කර්මාන්ත ණයගැති ශේෂ 08 ක්ද, 2001 වර්ෂයේ සිට ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.3,041,036 ක් වූ මුද්දර ගාස්තුද, 1993 වර්ෂයේ සිට ඉදිරියට ගෙනෙමින් පවතින අවස්ථා 15 කදී ලබා දී තිබුණු රු.159,278 ක සාමාන්‍ය අත්තිකාරම්ද නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**1.3.5 ගෙවිය යුතු ගිණුම්**

1991 වර්ෂයේ සිට නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.3,457,981 ක් වූ ණයහිමි ශේෂ 17 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

**1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු.116,438,448 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, මෝටර් රථ හා කරත්ත, ලී බඩු හා සවිකිරීම් සහ පුස්තකාල පොත් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද වත්කම් පන්ති අනුව පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයද, රු.1,368,902 ක් වූ අතැති තොග සම්බන්ධයෙන් තොග ලේඛනද, එකතුව රු.12,824,846 ක් වූ සේවක ණය හා ආපසු ගෙවිය යුතු තැන්පත් සඳහා කාල විශ්ලේෂණ වාර්තා යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 02 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.8,752,987 ක තැන්පත් ශේෂ 13 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 570 හා 571(1)(2) කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.12,950,972 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.6,445,200 ක් විය.

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,505,772 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදමේ සියයට 07 ක අඩුවීමක් පෙන්නුම් කළ ද, පුනරාවර්තන ආදායමින් සියයට 80 ක් තරම් පුනරාවර්තන වියදම් පැවතීම නිසා ආදායමට සාපේක්ෂව වියදම් ඉහළ මට්ටමක පැවතිණි.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ ආදායම් ආධාර, ස්වයං උත්පාදන ආදායම් සහ පුනරාවර්තන වියදම් සම්බන්ධයෙන් විස්තර පහත දැක්වේ.

| වර්ෂය | මුළු පුනරාවර්තන ආදායම | ආදායම් ආධාර මුදල් | ස්වයං උත්පාදන ආදායම | මුළු පුනරාවර්තන වියදම | ස්වයං උත්පාදන ආදායම ඉක්මවා ගිය පුනරාවර්තන වියදම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 66,450,443 | 32,265,112 | 34,185,331 | 53,499,471 | 19,314,140 |
| 2014 | 49,126,583 | 19,812,244 | 29,314,339 | 42,681,382 | 13,367,043 |
| 2013 | 44,422,879 | 15,036,688 | 29,386,191 | 38,962,953 | 9,576,762 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ ආදායම් ආධාර ලැබීම් වල වර්ධනයක් මෙන්ම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ස්වයං උත්පාදන ආදායම් වල වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

(ii) සභාවේ පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් සැලකිය යුතු අගයන්ගෙන් වැඩි වී තිබුණු නමුත්, ඒ පිළිබඳව අවධානය යොමුකර වියදම් පාලනය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(iii) සභාවේ ස්වයං උත්පාදන ආදායම් ප්‍රමාණය ඉක්මවා සෑම වර්ෂයකම පුනරාවර්තන වියදම් සැලකිය යුතු අගයන්ගෙන් අඛණ්ඩව වැඩි වී තිබුණු නමුත්, ආදායම් වර්ධනය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(iv) ආදායම් ආධාර නොලැබෙන්නට, සභාවේ ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් හැකියාවක් නොමැති බව වැඩිදුරටත් පෙන්නුම් කෙරුණි.

(v) ඉහත අංක (i) සිට අංක (iv) දක්වා ඡේද වල දැක්වෙන කරුණු අනුව ආදායම් ඉහල නංවා ගැනීම කෙරෙහි සභාව විසින් අවධානය යොමු කලයුතු බවත්, ඒ සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර, ක්‍රියාත්මක කළයුතු බවත්, එසේ නොමැති වුවහොත්, සභාවේ පවතින දුර්වල මූල්‍ය පාලන තත්ත්වය හේතුවෙන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ගැටළු සහගත තත්ත්වයන් උද්ගත වියහැකි බවත් විගණනයේ අදහසයි.

(ඇ) වැඩසටහන් අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම් හා වියදම් සසඳා බැලීමේ දී වැඩසටහන් 04 ක වියදමට වඩා අඩු වූ ආදායම් දක්නට ලැබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව ප්‍රාග්ධන ආදායම රු.9,500,000 ක් සහ ප්‍රාග්ධන වියදම රු.13,000,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබූ නමුත්, සභාවේ ස්වයං උත්පාදන ආදායමින් සියයට 30 ක් වත් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කර නොතිබුණි. එමෙන්ම ආදායම ඉක්ම වූ වියදම් සඳහා අරමුදල් උපයාගන්නා ආකාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවැති රු.3,420,941 ක හිඟයෙන් සහ රු.8,243,766 ක් වූ බිල් කිරීම් වලින් සියයට 69 ක් පමණක් වර්ෂය තුළ අය කරගෙන තිබූ අතර, වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු.3,561,119 ක් විය. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.2 අක්කර බදු

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවැති රු.132,114 ක හිඟය සහ වර්ෂයේ බිල් කිරීම් ඇතුළත්ව රු.145,615 ක් අය කරගත යුතුව තිබුණ ද, වර්ෂය තුළ අය කරගෙන තිබුණේ රු.3,589 ක් හෙවත් සියයට 02 ක් තරම් අඩු අගයකි. එසේ වුවද, හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තියේ විධිවිධාන කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

### 2.3.3 බදු කුලී

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවැති රු.74,697 ක හිඟයෙන් සහ රු.436,857 ක වර්ෂයේ බිල් කිරීම් වලින් සියයට 88 ක් පමණක් වර්ෂය තුළ අය කරගෙන තිබූ අතර, වර්ෂය අවසානයට තවදුරටත් රු.60,049 ක් අයකර ගතයුතුව තිබුණි. හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දීත් කටයුතු කර නොතිබුණි.

**2.3.4 බලපත්‍ර ගාස්තු**

----------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවැති රු.74,625 ක හිඟයෙන් සහ රු.758,250 ක බිල් කිරීම් වලින් සියයට 94 ක් වර්ෂය තුළ අය කරගෙන තිබුණි. වර්ෂය අවසානයට පැවැති හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.53,832 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.8,474,283 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) **කාර්ය මණ්ඩල කළමනාකරණය**

-----------------------------------

සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරු 02 ක පුරප්පාඩු පැවැති අතර, අතිරික්ත සේවක සංඛ්‍යාව 16 ක් විය. පුරප්පාඩු තනතුරු පුරවා ගැනීමට මෙන්ම අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) **භාණ්ඩ සමීක්ෂණය**

----------------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව කර්මාන්ත තොග ශේෂය තුළ භෞතිකව තිබෙන බව තහවුරු නොවූ පිරිවැය රු.70,005 ක් වූ භාණ්ඩ ඒකක 314 ක අගය පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) **සේවක ණය**

-------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.3,909,053 ක් වූ සේවක ණය ශේෂය තුළ විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා මියගිය නිලධාරීන්ගෙන් අයවියයුතු රු.91,624 ක ණය ශේෂ ඇතුළත්ව තිබුණු නමුත්, එම ශේෂ අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ගැසට් නිවේදනය අනුව සෑම විදුලි සංදේශ කුළුණක් සඳහා ම අනුකූලතා සහතික ලබා ගතයුතු අතර, එසේ ලබාගෙන නොමැති නම් එක් දිනකට රු.50 බැගින් දඩ

මුදල් අය කලයුතු බව දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී භාවිතයට ගෙන තිබුණු කුළුණු 08 ක් සඳහා අනුකූලතා ගාස්තු හා දඩ මුදල් වෙනුවෙන් රු.49,000 ක් අය කරගෙන නොතිබුණි.

(ආ) ස්ථිර කාර්යය මණ්ඩලයේ වැටුප් පමණක් පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණය කිරීම නිසා සභාව විසින් බඳවාගෙන තිබුණු සේවකයින්ගේ වැටුප් හා දීමනා ගෙවීමට සභාවේ ආදායමින් රු.1,752,265 ක වියදම් දැරීමට සිදු වී තිබුණි.

**3.3 කසල කළමනාකරණය**

**--------------------------**

කසල බැහැර කිරීම සඳහා සභාවට ආසන්නයේ ප්‍රධාන පාරට මුහුණ ලා ඇති සභාවට අයත් ක්‍රීඩාපිටියක් යොදාගෙන තිබුණු අතර, එම කසල වෙන් කිරීමක් හෝ ප්‍රතිචක්‍රීයකරණය කිරීමක් හෝ සිදු කර නොතිබුණු අතර, බැහැර කරන කසල වසා දැමීමට කටයුතු නොකිරීම නිසා ප්‍රදේශය පුරා දුර්ගන්ධය පැතිරී තිබුණු අතර, පරිසරයටද හානි සිදුවී තිබූ බව 2016 පෙබරවාරි 08 දින කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

----------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 02 ක රු.954,025 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයද, තවත් වියදම් විෂයයන් 05 ක සීමාවන් ඉක්මවා රු.5,603,995 ක වියදම්ද, ආදායම් විෂයයන් 02 ක ලඟාකර නොගත් ඉලක්කගත ආදායම් රු.20,507,374 ක්ද, තවත් ආදායම් විෂයයන් 05 ක ඉලක්කය ඉක්ම වූ රු.2,648,727 ක ආදායම්ද පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

------------------------

2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ච.ලේ දරන පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ චක්‍රලේඛය ප්‍රකාර අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. කෙසේ වුවද, සභාව විසින් පත්කර තිබුණු අභ්‍යන්තර විගණන නිලධාරියෙකුට සමාලෝචිත වර්ෂයේ දී වැටුප් හා දීමනා ලෙස රු.422,847 ක මුදලක් ගෙවා තිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

----------------------------------------

2009 ජූනි 09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2009(i) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂයේ දීත් කටයුතු කර නොතිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය**

**----------------------------**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**-----------------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ පවතින තක්සේරු කර නොමැති වාහන 04 ක් සහ පිරිවැය රු.1,540,000 ක් වූ ධාවනයට යොදා නොගන්නා වාහන දෙකක් 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ යේ විධිවිධාන අනුව අළුත්වැඩියා කර ප්‍රයෝජනයට යොදවා ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණු ට්‍රැක්ටරයට සවි කරන ලද ගලි බවුසරය සහ ට්‍රේලරය භාවිතයට නොගෙන සහා භූමියේ ගාල්කර තිබීම නිසා අළුත්වැඩියා කිරීමකින් තොරව එය භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත් වී තිබුණි.

**5. පද්ධති හා පාලන**

--------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) මානව සම්පත් කළමනාකරණය